# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No — 10120

ෆැක්ස්<br>தொலைநகல<br>Fax — 011-2171635

දුරකථන<br>தொலைபேசி<br>Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site — www.Police.lk

ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail — dir.media@police.gov.lk


මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO — 1392/ 2024

ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No — / 2024

දිනය<br>திக<br>Date — 28/08/2024 පැය 1255

## මාධ්‍ය නිවේදනය

**රිය අනතුරක් සිදු කර පොලිස් නිලධාරියෙකුට තුවාල කිරීම හා මිනී මැරීමට තැත් කිරීමක් සිදු කර පලා ගොස් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ගුවන්තොටුපල ඒකකය.**

2024.02.16 වන දින වැල්ලවත්ත පොලිස් වසමේ හැව්ලොක් සිටි ඉදිරිපිටදී පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් කණ්ඩායමක් විසින් සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීමට යාමේදී එම සැකකරු පැමිණි මෝටර් රථය විශේෂ කාර්ය බලකා නිලධාරීන්ගේ හා එම යතුරුපැදියක ගැටීමට සලස්වා එක් නිලධාරියෙකුට තුවාල සිදු කර සැකකරු පලාගොස් තිබිණි.

මෙම පලාගිය සැකකරු විදේශගතව සිටින ප්‍රබල මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකුගේ පුත්‍රයෙකු බවට වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වී ඇති අතර ගල්කිස්ස ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කිරීමෙන් පසු සැකකරු අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කිරීමට පොලිසියට නියෝග කර ඇත.

ඒ අනුව සිද්ධියට සම්බන්ධ පලාගිය සැකකරු 2024.08.27 වන දින රාත්‍රී කාලයේ විදේශගතව සිට දිවයිනට පැමිණෙන බවට ලද තොරතුරක් අනුව කටුනායක ගුවන්තොටුපලේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කණ්ඩායමක් විසින්, විශේෂ කාර්ය බලකා නිලධාරියෙකුට තුවාල සිදුකර රියදුරු පලා යාම හා මිනී මැරීමට තැත් කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන වැල්ලවත්ත පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන වනරතන පාර, දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**වැල්ලවත්ත පොලිස් ස්ථානය මගින් වැඩිදුර විමර්ශන කටයුතු සිදු කරනු ලබයි.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**